ඉන්දියානු මහ කොමසාරිස් කාර්යාලය

කොළඹ

***

**<u>පුවත්පත් නිවේදනය</u>**

**<u>කොවිඩ් 19 වසංගතය හේතුවෙන් සංශෝධිත සංචාරක අනතුරු ඇඟවීම</u>**

1. විදේශිකයන්ට ලබා දී ඇති රාජ්‍ය තාන්ත්‍රික, නිල, එක්සත් ජාතීන්ගේ සංවිධානය සහ ජාත්‍යන්තර සංවිධාන, රැකියා සහ ව්‍යාපෘති වීසා හැර දැනට පවත්නා සියලූ වීසා බලපත්‍ර ඉන්දියානු රජය විසින් ජාත්‍යන්තර මගී ආගමන සහ විගමන මත පනවා ඇති තහනම ඉවත් කෙරෙන තෙක් අත්හිටුවා තැබෙනු ඇත.

2. ඉන්දියාවේ සිරව සිටින සාමාන්‍ය වීසා, ඊ-වීසා හෝ රැඳී සිටීමේ කොන්දේසි මත සිටින විදේශිකයන්ගේ වීසා බලපත්‍රයන්හි වලංගු කාලසීමාව ඉකුත් වී ඇත්නම් හෝ 2020 පෙබරවාරි පළමු වන දින සිට ඉන්දියානු රජය විසින් ජාත්‍යන්තර මගී ආගමන සහ විගමන මත පනවා ඇති තහනම ඉවත් කෙරෙන දිනය දක්වා කාලසීමාව තුළ ඉකුත් වන්නේ නම් ඒ අය ගෙවීම් රහිත පදනම මත තම වීසා බලපත්‍රයන්හි කාලසීමාව දීර්ඝ කර ගැනීම සඳහා විදේශිකයන් ලියාපදිංචි කිරීමේ කලාපීය නිලධාරීන් (FRRO) වෙත අයදුම් කළ හැකිය. ඉන්දියාව විසින් ජාත්‍යන්තර සංචාර තහනම ඉවත් කෙරෙන දින සිට දින 30ක් දක්වා දඩ මුදලකින් තොරව වීසා කාලසීමාව දීර්ඝ කෙරෙනු ඇත. විදේශිකයන් ඉල්ලුම් කරන්නේ නම් මෙම පදනම මතම පිටවීමට අවස්ථාව ලබා දෙනු ඇත.

3. OCI බලපත්‍ර හිමියන්ට ලබාදෙන වීසා රහිත සංචාරක පහසුකම ඉන්දියානු රජය විසින් ජාත්‍යන්තර මගී ආගමන සහ විගමන මත පනවා ඇති තහනම ඉවත් කෙරෙන තෙක් අත්හිටුවා තැබෙනු ඇත. අත්‍යාවශ්‍ය හේතුවක් මත ඉන්දියාවට යාමට අපේක්ෂා කරන යම් OCI බලපත්‍ර හිමියෙකු වේ නම් ඔහුට/ඇයට ළඟම පිහිටි ඉන්දියානු තානාපති කාර්යාලය හා සම්බන්ධ විය හැකිය. දැනටමත් ඉන්දියාව තුළ සිටින OCI බලපත්‍ර හිමියන්ගේ OCI බලපත්‍ර ඔවුන් ඉන්දියාවේ සිටින තෙක් වලංගු වනු ඇත.

*****

කොළඹ

2020 මැයි 11